නිකවැරටිය ප්‍රාදේශීය සභාව

---------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශනඉදිරිපත්කිරීම</u>

සමාලෝචිතවර්ෂයේ මූල්‍ය ප්‍රකාශන2012 මාර්තු 30 දින ද ඉකුත්වර්ෂයටඅදාල මූල්‍ය ප්‍රකාශන2011 මාර්තු 31 දින ද විගණනයටඉදිරිපත්කරතිබූඅතරසමාලෝචිතවර්ෂයේ විගණකාධිපති වාර්තාව2012 සැප්තැම්බර්27දිනසභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මාගේපරීක්ෂණයෙන් පෙනීයනඅන්දමටසහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම්අනුවනිකවැරටිය ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වර්ෂය සඳහා නිසිගිණුම්වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේවාර්තාවේ දක්වා ඇතිකරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලටවන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනටනිකවැරටිය ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳතත්ත්වය සහ එදිනෙන් අවසන්වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලසත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත්ගිණුම්කරණ මූලධර්ම වලටඅනුකූලව මූල්‍ය ප්‍රකාශනපිළියෙල කරඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශනපිළබඳඅදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණඅඩුපාඩු</u>

පහත නිරීක්ෂණයන්කරනු ලැබේ.

(අ). සමාලෝචිතවර්ෂයටඅදාලවරිපනම් බදු ආදායම, ආදායම් හා වියදම් ගිණුමට රු.9,000,000 ක්වැඩියෙන් හා වර්ෂ අවසානයේ වරිපනම් බදු හිඟයද එම ප්‍රමාණයෙනවැඩියෙන්ගිණුම්ගතකරතිබුණි.

(ආ). සමාලෝචිතවර්ෂයේ කර්මාන්ත ණය හිමියන් වෙනුවෙන් පෙරවර්ෂයේදීඇති කළ ප්‍රතිපාදනයෙන් ණය හිමියන්සඳහා ගෙවා ඉතිරියවූ රු.7,397,286 ක ප්‍රමාණය සමුච්චිත අරමුදල්ගිණුම බැරකිරීම වෙනුවට ජනල්සටහන් 53 න්ප්‍රාග්ධන වියදම් ගිණුම (වැය ශීර්ෂ 309) බැරකරතිබුණි. ඒ හේතුවෙන්සමාලෝචිතවර්ෂයටඅදාලප්‍රාග්ධන වියදම රු.7,397,286 ක්අඩුවෙන්ගිණුම්ගතවතිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

<u>තොරතුරු විගණනයටඉදිරිපත් නොකිරීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයටඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.41,084,703ක්වූ ගනුදෙනුවිගණනයේදීසතුටුදායක ලෙසසන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනඅනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,910,732 ක්වූ අතර, ඊටඅනුරූපීවඉකුත්වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,488,289 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පර්පාලන )රීති මාලාවේ රීති 14 අනුව යම් වැය විෂයකප්‍රතිපාදනප්‍රමාණවත් නොවන විටවැය මාරු යටතේ හෝ පර්පූරක යටතේප්‍රතිපාදනසලසා ගත යුතුවුවද සභාවවිසින්සමාලෝචිතවර්ෂයටඅදාලවවැය විෂයන් 10 ක රු.234,991 ක අධිවැය ද වැය විෂයන් 43 ක රු.2,559,781 ක ප්‍රතිපාදනඉතිරිවීම් පැවතුණි.

### 2.3 ආදායම් පර්පාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින්සමාලෝචිතවර්ෂයටඅදාලවඉදිරිපත්කරතිබ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනටසමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු000' | රු.000' | රු.000' |
| (i). | වර්පනම් හා බදු | 1,016 | 1,134 | 1,072 |
| (ii). | බදුකුලී | 6,672 | 6,787 | 10 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 434 | 434 | 16 |
| (iv). | වෙනත් ආදායම් | 10,000 | 11,566 | 12,061 |

#### 2.3.2 වර්පනම්බදු

සමාලෝචිතවර්ෂය අවසානයටවර්පනම්බදු හිඟය රු.1,061,208ක්වූ අතර, 1987 අංක15 දරණප්‍රාදේශීය සභා පනතේ 158 හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පර්පාලන ) රීති මාලාවේ 33-42 රීතිවල දක්වා ඇතිපර්දිකාලානුරූපව හිඟ ලැයිස්තුසකස්කිරීමක් හෝ වරෙන්තුනිකුත්කිරීමක්සිදුකර නොතිබුණි.

#### 2.3.3 වෙළඳබලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරණප්‍රාදේශීය සභා පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පර්පාලන )රීති මාලාවේ 59 රීතිය අනුවසමාලෝචිතවර්ෂයටඅදාලවක්ෂේත්‍රපර්ක්ෂාවකරනොතිබුණි. 2010 වසර තුලව්‍යාපාරස්ථාන 915 ක්සඳහා වෙළඳබලපත්‍රලබාගෙනතිබුණද, 2011 වර්ෂයටව්‍යාපාරස්ථාන 643

ක්සඳහා පමණක් වෙළඳබලපත්‍රලබාගෙනතිබුණුඅතරක්ෂේත්‍රපරීක්ෂාව මගින්අනිකුත්ස්ථාන හඳුනා ගැනීමටකටයුතුකර නොතිබුණි.

2.3.4 බදුකුලී

සමාලෝචිතවර්ෂය අවසානයට හිඟහිටි බදුකුලී (කෙටි කාලීන) රු.219,523 ක් හා හිඟහිටි බදුකුලී (දීර්ඝකාලීන) රු.417,814 ක් පැවතිඅතර, දීර්ඝකාලීන හිඟහිටි බදුකුලීවලින් රු.308,777 ක් 2004 වර්ෂයට පෙරසිට පැවත එන්නක් වී තිබුණි.

2.3.5 මස් හා මාළු කඩකුලී

මිල්ලගොඩවැව් මාළු ලැල්ල හා ගලපිටියාගම මුහුදු මාළු ලැල්ලසමාලෝචිතවර්ෂයටඅදාළව බදුදීමේදී නිසිපරිදිගිවිසුම්වලට එළඹ නොතිබුණි. ඉකුත්වර්ෂයේ රු.200,200 කට ටෙන්ඩර්ගත වී තිබූ මෙකී මාළු ලැලි වලින්සමාලෝචිතවර්ෂය තුළ අයවීතිබුනේ රු.57,500 ක්පමණි. එමෙන්ම 1993වර්ෂයේ සිට 2003 කාලයටඅදාළව මස්කඩ හා මාළුකඩ බදුකරුවන්ගෙන් අවස්ථා 10 යටතේ පැවති රු.483,380 ක හිඟ මුදලක්අයකරගැනීමටකටයුතුකර නොතිබුණි.

2.4 ආර්ථික නොවූ ගනුදෙනු

නිකවැරටිය සතිපොළ 1999 වර්ෂයට බදුදීම පිණිස ටෙන්ඩර්පත් 02 ක්නිකුත්කරතිබුණුඅතරඉන්එක ටෙන්ඩර්පතක් විවෘත නොකිරීම නිසා එම ටෙන්ඩරය ඉදිරිපත්කල අය විසින් මහව දිසා අධිකරණයේ පවරා තිබූ 4864/L දරණනඩුවේතීරණය ප්‍රකාරවඅලාභ ලෙස රු.80,000 ක් හා නඩු ගාස්තු ලෙස රු.10,000ක්වශයෙන් රු.90,000 ක් 2011 සැප්තැම්බර්07 දිනසහා අරමුදලින්පැමිණිලිපාර්ශවය වෙත ගෙවා තිබුණි.

2.5 මානවසම්පත් කළමනාකරණය

සභාවේ පහත සඳහන්තනතුරු වල පුරප්පාඩු පැවතුණි.

| තනතුරු | සංඛ්‍යාව |
|---|---|
| ලේකම් | 1 |
| ආදායම් පාලක | 2 |
| පුස්තකාලාධිපති | 1 |

2.6 කොන්ත්‍රාත්පරිපාලනය

2010 පළාත්නිශ්චිතසංවර්ධනප්‍රදානවිශේෂව්‍යාපෘති යටතේවයඹ පළාත්පාලන දෙපාර්තමේන්තුවෙන් කැලේගම පානීය ජලව්‍යාපෘතිය සඳහා රු.3,400,000 ක ප්‍රතිපාදනසලසා තිබුණි. ඊටඅදාල පළාත්පාලනසහකාර කොමසාරිස්ගේඋපදෙස්පරිදිසියලු වැඩ විෂයයන්වල බිල්පත්සමාලෝචිතවර්ෂය අවසන්වන විටඉදිරිපත්කරන ලෙසත්වර්ෂයේදී ගෙවීම්කල නොහැකිකර්මාන්තඉදිරිවර්ෂයේදීඅවිච්ඡේද වැඩ

විෂයයන් ලෙසකිර්මටඅනුමැතිය නොලැබෙන බව දක්වා තබුණි. එහෙත්සමාලෝචිතවර්ෂය අවසන්වන විට මෙහි වැඩ අවසන් වී නොතිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන්කරනු ලැබේ.

(අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන )රීති මාලාවේ රීතිඅංක 218 ප්‍රකාරවඉඩම් හා ගොඩනැගිලිසමීක්ෂණයකර නොතිබුණි.

(ආ) සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත්පාලන විශ්‍රාම වැටුප්අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ටඅදාලවසභාවවිසින්එකීඅරමුදලට ගෙවිය යුතු දායක මුදල්නිසිපරිදි නොගෙවීම නිසා සමාලෝචිතවර්ෂය අවසානය වන විටඑකීඅරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 3,554,669 වතිබුණි.

(ඇ) ආයතනයටඅදාලවසංයුක්තසැළැසමක් හා සමාලෝචිතවර්ෂයේ ක්‍රියාකාරිසැලැස්මක් නොතිබුණි.

2.8. ඝණඅපද්‍රව්‍ය කළමනාකරණය

නිකවැරටිය නගරය තුලඑකතුවන කසළ බැහැර කිරිම සඳහා බෝගොල්ලාගම ප්‍රදේශයේ සභාවට පවරා ගන්නා ලද ඉඩමක රු.3,098,427 ක වියදමකින් කොම්පෝස්ට්අංගනයක්ඉදිකරමින්තිබුණඅතර මෙම ස්ථානයට කසළ බැහැර කිරිමට හැකියාවතබියදී පෞද්ගලිකඉඩම්වල වලවල්සකසාකසල දැමීම සඳහා සමාලෝචිතවර්ෂය තුළ රු.148,400 ක මුදලක්වැයකරතිබුණි.

2.9 අභ්‍යන්තරවිගණනය

සභාවේ ප්‍රමාණවත්අභ්‍යන්තරවිගණනයක්සිදුව නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන්පද්ධති හා පාලනක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමණාකරණය

(ඉ) කොන්ත්‍රාත්පරිපාලනය